**<u>මූල්‍යාධාර ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක</u>**

- අනුමත සැත්කමක් / ප්‍රතිකාරයක් වීම.
- සැත්කම් / ප්‍රතිකාර අනුමත රෝහලකින් සිදුකිරීම
    - අනුමත රෝහල් ලයිස්තුව QR කේතය මඟින් හෝ www.presidentsfund.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ ඔබගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
- නියමිත කාල සීමාව තුළ වෛද්‍යාධාර අයදුම්පත භාරදී තිබීම.
- රෝගියාගේ සහ පවුලේ සියලු සාමාජිකයින්ගේ මාසික ආදායම්වල එකතුව රු. 200,000.00ට අඩු විය යුතුය.
    - විවාහක දරුවන්ගේ ආදායම සලකා බලනු නොලබන අතර, අවිවාහක දරුවන්ගේ මාසික ආදායමෙන් 50%ක් පවුලේ ආදායම සඳහා සලකා බලනු ලැබේ.
- තම සංචිත මුල්‍ය වත්කම් මඟින් සැත්කම් / ප්‍රතිකාර සඳහා වියදම් ප්‍රතිපූර්ණය කළ නොහැකි වීම.
- වෙනත් පරිත්‍යාග, රක්ෂණාවරණයක් හෝ වෙනත් ආකාරයක් මඟින් වියදමෙන් 50%ක් ආවරණය නොවීම
- අනුමත උපරිම මූල්‍යාධාරය ලබා නොතිබීම.
- සත්‍ය හා නිවැරදි තොරතුරු සපයා තිබීම.



**මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබාගත හැකි ආකාර**

- ඔබ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින්
- ඔබ පදිංචි ප්‍රදේශය අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්
- ජනාධිපති අරමුදල ඇමතීමෙන්
    - දුරකතන අංක - 011-2354354 දිගුව 4800
- www.presidentsfund.gov.lk යන ජනාධිපති අරමුදලේ නිල වෙබ් අඩවිය වෙත පිවිසීමෙන්
- ජනාධිපති අරමුදලේ නිල ෆේස්බුක් පිටුව වෙතින්
- ජනාධිපති අරමුදලේ නිල යූටියුබ් නාලිකාව වෙත පිවිසීමෙන්

**"අපි සැමවිටම අවංක හා සත්‍යවාදීව කටයුතු කර ප්‍රතිලාභ අවැසි නම් පමණක් ලබාගනිමින් අනාගතයේ රෝගී වන පුද්ගලයෙකුගේ, අපේම ඥාතියෙකුගේ ජීවිතය සුරැකීමට දායක වෙමු !"**

**ජනාධිපති අරමුදල**
බිම් මහල,
ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් ගොඩනැගිල්ල
ජනාධිපති මාවත
කොළඹ 01.

දුරකතන අංකය - 0112354354 දිගුව - 4800
ෆැක්ස් අංකය - 0112331243
වට්ස්ඇප් අංකය - 0740854527
විද්‍යුත් ලිපිනය - fundsecretary@presidentsoffice.lk
වෙබ් අඩවිය - www.presidentsfund.gov.lk



## ජනාධිපති අරමුදල ඔබේ ගමට..

ජනාධිපති අරමුදල මඟින් ලබාදෙන වෛද්‍යාධාර අයදුම්පත් භාරදීම සඳහා දැන් ඔබ කොළඹට පැමිණීම අවශ්‍ය වන්නේ නැහැ.

දැන් ඔබට ඔබ පදිංචි ප්‍රදේශය අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් වෛද්‍යාධාර අයදුම්පත භාරදීමට හැකියි.

**ජනාධිපති අරමුදලෙන් මූල්‍යාධාර ලබාගත හැකි සැත්කම් / ප්‍රතිකාර සහ මූල්‍යාධාර ප්‍රමාණ**

| | | |
|---|---|---|
| **හදවත් සැත්කම්** | | |
| බයිපාස් සැත්කම් (CABG) | - | රු.250,000.00ක උපරිමයක් දක්වා |
| ස්ටෙන්ට් සැත්කම් (PCTA) | - | රු.300,000.00ක උපරිමයක් දක්වා |
| ඉහත සැත්කම් ද ඇතුළුව හෘදය ආශ්‍රිත සැත්කම් 37ක් සඳහා | | |
| **වකුගඩු ආශ්‍රිත ප්‍රතිකාර / සැත්කම්** | | |
| වකුගඩු බද්ධ කිරීම | - | රු.500,000.00ක උපරිමයක් දක්වා |
| රුධිර කාන්දුකරණය | - | රු.500,000.00ක උපරිමයක් දක්වා |
| **පිළිකා ප්‍රතිකාර** | | |
| පිළිකා ප්‍රතිකාර සඳහා උපරිමය රු. 500,000.00 දක්වා | | |
| **මොළය ආශ්‍රිත සැත්කම්** | | |
| Brain Tumor | - | වියදමෙන් 1/3ක් හෝ රු. 600,000.00 උපරිමය දක්වා |
| ඉහත සැත්කම් ද ඇතුළුව තවත් සැත්කම් 08ක් සඳහා | | |
| **විකලාංග රෝපණය (Orthopaedic Implant)** | | |
| උකුල් ඇට බද්ධය (Hip) | - | රු.300,000.00 උපරිමයක් දක්වා |

| | | |
|---|---|---|
| දණහිස් බද්ධය (Knee) | - | රු.300,000.00 උපරිමයක් දක්වා |
| උරහිස් බද්ධය (Shoulders) | - | රු.300,000.00 උපරිමයක් දක්වා |
| **සුෂුම්නාව ආශ්‍රිත සැත්කම්** | - | රු. 300,000.00 දක්වා |
| **ඇට මිදුළු බද්ධ කිරීම** | | |
| ඇට මිදුළු බද්ධ කිරීම | - | රු. 600,000.00 දක්වා |
| ප්‍රාථමික සෛල බද්ධ කිරීම | - | රු. 600,000.00 දක්වා |
| **අක්මාව ආශ්‍රිත සැත්කම් / ප්‍රතිකාර** | | |
| අක්මා බද්ධ කිරීම | - | රු. 600,000.00 |
| සැත්කමට පෙර/ පසු ප්‍රතිකාර හා ඖෂධ සඳහා | - | රු. 300,000.00 |
| **දරුවන් සඳහා අක්මා බද්ධ කිරීම** | | |
| වයස අවුරුදු 16ට අඩු දරුවන්ගේ රාගම රෝහලේ සිදු කරනු ලබන අක්මා බද්ධ කිරීම් සඳහා | - | රු. 1,000,000.00 |
| | | |
| **කර්ණ ශංඛ බද්ධය** | | රු. 600,000.00 |
| **ශ්‍රවණ උපකරණ** | | වියදම රු. 400,000.00ට අඩු නම් එයින් අඩක් හෝ උපරිමය රු. 300,000.00 දක්වා |
| **ප්ලාස්ටික් සැත්කම් / OMF සැත්කම්** | | රු. 100,000.00 |



**අයදුම් කිරීම**

ජනාධිපති අරමුදලේ මූල්‍යාධාර ලබා ගැනීමේ අයදුම්පත්‍රය සම්පූර්ණ කර උපදෙස් පත්‍රිකාවේ සඳහන් අවශ්‍ය අනෙකුත් ලේඛන සමඟ ඔබට ප්‍රතිලාභ සඳහා අයදුම් කළ හැක.

**අයදුම්පත්‍රය ලබා ගත හැකි ආකාරය**

- www.presidentsfund.gov.lk වෙබ් අඩවිය මඟින් බාගත කිරීමෙන්
- QR කේතය මඟින්

**අයදුම් කල යුතු ආකාරය**

- සැත්කමට/ ප්‍රතිකාරයට දින 30කට පෙර අයදුම්පත්‍රය භාර දිය හැක.

එසේ නොමැතිනම්

- සැත්කම හෝ ප්‍රතිකාරය සිදු කර රෝහලෙන් බැහැර වී දින 60ක් ඉක්මවීමට පෙර භාර දිය හැක.

**අවශ්‍ය අනෙකුත් ලේඛන**

- රෝගයට අදාළ වෛද්‍ය නිර්දේශයේ මුල් පිටපත
- සැත්කමට / ප්‍රතිකාරයට පෙර අයදුම්පත්‍රය භාර දෙන්නේ නම්,
  - සැත්කම / ප්‍රතිකාරය සඳහා යන වියදම් ඇස්තමේන්තුවේ මුල් පිටපත
- සැත්කමට / ප්‍රතිකාරයට පසු අයදුම්පත්‍රය භාර දෙන්නේ නම්,
  - සැත්කමට / ප්‍රතිකාරයට අදාළ ගෙවීම්වල මුල් කුවිතාන්සි පත් (Receipts)



- රෝගියාගේ හා පවුලේ අයගේ බැංකු ගිණුම් වාර්තා ( ආසන්න මාස 03ක)
- රෝගියාගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්
- රෝගියාගේ හා පවුලේ සාමාජිකයින්ගේ (බිරිඳ හෝ ස්වාමියා / අවිවාහක දරුවන්) වැටුප් / ආදායම් විස්තර
- දිවුරුම් ප්‍රකාශ
- ණය ලබා ගැනීම, රන් භාණ්ඩ උකස් කිරීම් වේ නම්, තහවුරු කරන ලේඛන පිටපත්
- අවශ්‍ය වෙනත් ලේඛන

**ඔබට ප්‍රතිලාභ ලැබෙන ආකාරය**

- ඔබ සැත්කම/ ප්‍රතිකාරය ලබාගැනීමෙන් පසුව මූල්‍යාධාර අයදුම් කර ඇත්නම්, ජනාධිපති අරමුදල විසින් ඔබ මූල්‍යාධාර ලබා ගැනීමේ සුදුස්සෙක් ලෙස තෝරා ගනු ලැබුවහොත් ඔබට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මුදල් ලබා ගත හැකි වේ.

- ඔබ සැත්කම/ ප්‍රතිකාරය කිරීමට පෙර මූල්‍යාධාර අයදුම් කර ඇත්නම්, ජනාධිපති අරමුදල විසින් ඔබ මූල්‍යාධාර ලබාදීමට සුදුස්සෙකු ලෙස තෝරා ගනු ලැබුවහොත් සැත්කමට / ප්‍රතිකාරයට නියමිත දිනට පෙර අදාළ රෝහල වෙත අනුමත මුදල දක්වමින් වගකීම් ලිපියක් ජනාධිපති අරමුදල විසින් නිකුත් කරනු ලබයි.

  (ඔබගේ සැත්කම/ ප්‍රතිකාරය සිදු කිරීමෙන් පසු අදාළ රෝහල විසින් බිල්පත් ඉදිරිපත් කර ජනාධිපති අරමුදලෙන් මුදල් ප්‍රතිපූරණය කර ගනු ඇත.)